# ප්‍රසම්පාදන දැන්වීමයි

**වරකාපොල ප්‍රාදේශීය සභාව -සබරගමුව පළාත් සභාව**

01. පහත සඳහන් වැඩ විෂය සඳහා වරකාපොල ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2024.11.04 වන දින පෙ.ව.11.00 දක්වා ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාර ගැනේ.

| අනු අංකය | වැය විෂය | දළ ඇස්තමේන්තු වැඩ වටිනාකම (රු.මි) | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරය(රු) | කොන්ත්‍රාත් ලියාපදිංචි වටිනාකම් කාණ්ඩය |
|---|---|---|---|---|---|
| 01 | වරකාපොල ප්‍රාදේශිය සභා කාර්යාලය සඳහා නව වැසිකිළි පද්ධතියක් ස්ථාපනය කිරීම | රු.මි.7.9 | 1500.00 | 79000.00 | C6/C7 |

02. මෙම ලංසු කැදවීම ජාතික තරඟකාරි ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර, මෙම කර්මාන්තය රු.මි.10ට වඩා අඩු බැවින් රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ අංක 04/2016 (ii) හා 04/2016 (iii) අනුව ප්‍රාදේශීය ප්‍රමුඛතා හා අදාළ (CIDA) ශ්‍රේණිගත ප්‍රමුඛතාවය පදනම් කර ගනිමින් වරකාපොල ප්‍රාදේශිය සභා කාර්යාලය සඳහා නව වැසිකිළි පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ලංසුකරුවකු තෝරා ගැනීම සිදු කරනු ලැබේ. එම චක්‍රලේඛයට අදාළව පසුව නිකුත් කරන රාජ්‍ය මුල්‍ය චක්‍ර ලේඛ 03/2020,03/2020( i) හා 04/2016(iv) චක්‍රලේඛයන්ද ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාළ වේ.

03. 2024.10.18 දින සිට 2024.11.01 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා ඉහත සඳහන් පරිදි ගාස්තු ගෙවීමෙන් වරකාපොල ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලංසු ලේඛන ලබා ගත හැකිය.ගෙවීම් මුදලින් කළ යුතුය.

04. සියලු ලංසුකරුවන් මෙම කර්මාන්තය සඳහා ඉහත සඳහන් ලංසු බැදුම්කර වටිනාකමට අදාළව ලංසු බැදුම්කර වශයෙන් පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් 2024.11.04 දින සිට 2025.03.03 දින දක්වා වලංගුවන පරිදි ලේකම්, ප්‍රාදේශීය සභාව, වරකාපොල ප්‍රතිලාභියා ලෙස නම් කර ලබා ගත් ලංසු බැදුම්කරයක් මගින් හෝ අදාළ කර්මාන්තය නමින් ලංසු සුරක්ෂණ මුදල ලෙස ප්‍රාදේශීය සභාවේ අදාළ මුදල් තැම්පත් කර ලබා ගත් රිසිට්පත ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.

05. මෙම කර්මාන්තය පිළිබඳ විස්තර වරකාපොල ප්‍රාදේශිය සභාව වෙත පැමිණ හෝ දුරකථන අංක 035-2267275 වෙතින් කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැකිය. නැතහොත් www.warakapolaps.lk වෙබ් අඩවියට පිවිසෙන්න. අවශ්‍ය අයෙකුට සතියේ වැඩ කරන දිනයන්හි නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

06. මුද්‍රා තබන ලද ලංසු 2024.11.04 වන දින පෙ.ව.11.00 හෝ ඊට පෙර වරකාපොල ප්‍රාදේශිය සභා කාර්යාලයේදී මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීම කළ යුතුය.ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු මුල් පිටපත හා අනු පිටපත වශයෙන් වෙන වෙනම කවරවල බහා එම කවර දෙකම එක කවරයක බහා එම කවරයේ වම් පස ඉහළ කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

07. 2024.11.04 දින පෙ.ව.11.00 ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම වරකාපොල ප්‍රාදේශිය සභා කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ.ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරු හෝ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

08. ලංසුපත් සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය වරකාපොල ප්‍රාදේශිය සභා ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

09. සියලුම ලංසු 2025.02.03 වන දින දක්වා වලංගු විය යුතුය.

2024.10.16 දින

ලේකම් හා
බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ප්‍රාදේශීය සභාව,
වරකාපොල.

වරකාපොළ ප්‍රාදේශීය සභාව
வரகாபொல பிரதேச சபை
Warakapola Pradeshiya Sabawa